www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ශ්‍රී ලංකාවේ සසප කයිට්ස්හි ඊපීඩීපී මැරකම් හෙළා දකී

## Sri Lankan SEP condemns EPDP thuggery on Kayts

**සමාජවාදී සමානතා පක්ෂය විසිනි.**
**2010 පෙබරවාරි 1**

ජනාධිපතිවරනයෙන් පසුව ජනවාරි 28 දා ඊලම් මහජන ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂ (ඊපීඩීපී) මැරයන් උතුරේ කයිට්ස් දූපතෙහි සිදු කල මැර ක්‍රියාවන්, සමාජවාදී සමානතා පක්ෂය (සසප) හෙළා දකී. නිසැකව ම ඔවුන් තැතිගැන්මට පත්කලේ, ජනාධිපති මහින්ද රාජපක්ෂ ලද අඩු ඡන්ද සංඛ්‍යාවෙන් ද ඡන්දදායකයන්ගේ අඩු සහභාගිත්වය ද නිසා ය. ඡන්දය නොදීම ගැන ද විපක්ෂ අපේක්ෂක ජනරාල් සරත් ෆොන්සේකාට හෝ සසප අපේක්ෂක විජේ ඩයස්ට ඡන්දය දීම ගැන ද දෝෂාරෝපනය කරමින්, ඊපීඩීපී කල්ලියක් තරුන සහ මහලු පුද්ගලයන් ද ඇතුලු පුද්ගලයින් දුසිම් ගනනකට කායිකව පහර දුන්හ.

කයිට්ස්හි හා අසල පිහිටි අනෙකුත් දූපත්වල දී මිලිටරිය සමග සමීපව වැඩ කරන ඊපීඩීපී සන්නද්ධ කන්ඩායමක් මෙය සිදුකර තිබේ. පක්ෂය රාජපක්ෂගේ පාලක සන්ධානයේ කොටස් කරුවෙකු වන අතර එහි නායක ඩග්ලස් දේවානන්ද කැබිනට් ඇමතිවරයෙකි. රාජපක්ෂ තන්ත්‍රය එල්ටීටීඊ සංවිධානයට එරෙහි යුද්ධය යලි ආරම්භ කල තැන් පටන් ගෙවී ගිය වසර ගනනාව තිස්සේම ඊපීඩීපී මිලිටරිය සමග සමීපව ක්‍රියා කරමින් ප්‍රදේශයේ ජනයා බිය ගැන්වීමේ සහ ත්‍රස්ත කිරීමෙහි යෙදී සිටියහ.

ජනවාරි 28 දා සවස 5ට පමන, ඊපීඩීපී මැර කල්ලියක් කයිට්ස් දූපතෙහි පිහිටි අම්පිහෙයිනගර්, වෙඩ්ඩිපුලම්, වේලනයි හතර වන කොටස, තුරෙයියූර් සහ පුලියන්කුඩල් ගම්මානවල හයිඒස් වෑන් රියකින් සැරිසැරූහ. බොහෝ ගම්වැසියන් දුප්පත් ධීවරයන් ය. මැරයෝ පොලු මුගුරු වලින් සන්නද්ධ ව සිටියහ.

මැර කල්ලිය මුලින් ගම්වැසියන්ට චෝදනා කලේ ඡන්දය නොදීම ගැන ය. නොමැකෙන තීන්ත ගෑ සිය අත් පෙන්වමින් ජනයා තමන් ඡන්දය දුන් බව තහවුරු කල විට මැරයෝ ඔවුන්ට මෙසේ ප්‍රසිද්ධියේම බැන වැදුනෝය. "උඹලා ඡන්දෙ දුන්නෙ ෆොන්සේකාට. නැත්නම් කතුරට [සසපයේ ඡන්ද ලකුන]. අපි අතීතයේ උඹලට උදව් කරල තියෙනවා. උඹලා අපිට යි ආන්ඩුවට යි කලගුන සලකලා නැහැ."

ගමක් ගමක් පාසා යමින්, සුලු හෝ ප්‍රකෝප කිරීමකින් තොරව, ඊපීඩීපී කල්ලිය පාරවල්වල සිටි පිරිමි ගම්වැසියන්ට පහර දෙන්නට පටන් ගත්තේ ය. පහර කෑ පුද්ගලයන් *ලෝක සමාජවාදී වෙබ් අඩවියට* පවසා ඇති පරිදි, ඇතැමුන්ට රෝහලට ගොස් වෛද්‍ය ප්‍රතිකාර ලැබීමට වුවමනා කල නමුත් තව දුරටත් පහර එල්ල වේ යැයි බියෙන් ඔවුහු නො ගියහ. රෝහලට ගිය අය ද එම හේතුව නිසා ම තමන්ට පහර දුන් අයගේ නම් සහ ඔවුන්ගේ දේශපාලන සම්බන්ධකම් දැන සිටිය ද පොලීසියට පැමිනිලි නො කලහ.

29 දා උදෑසන මැර කල්ලිය අම්පිහෙයිනගර් වෙත පෙරලා පැමිනියහ. ප්‍රදේශය තුල පැතිර පවතින නොරිස්සුම් සහගත භාවය ගැන නිසැකව ම දැන සිටි මැරයෝ තමන් කෝපයට පත්ව හැසුරුනේ මහජනයාට වෙඩි තැබීම සඳහා පැවති නාවික හමුදා රහස් ඔත්තු සේවයේ සැලැස්මක් වැලැක්වීමට යැයි විසුලු සහගත ලෙස ප්‍රකාශ කලහ. සැබෑව නම්, කයිට්ස්හි දී ඊපීඩීපීය ක්‍රියා කරන්නේ නාවික හමුදා රහස් ඔත්තු සේවයේ අනුබද්ධ සංවිධානයක් ලෙස ය යන්න යි.

29 දින හැන්දෑවේ යලි පෙරලා පැමිනි ඊපීඩීපීය, ගම්වැසියන් උතුරේ ප්‍රධාන නගරය වන යාපනයේදී 30 දා පැවැත්වෙන විරෝධතාවකට සහභාගි විය යුතු යැයි නියෝග කලහ. මන්දැයි ඇතැම් ජනයා විමසූ විට, ප්‍රශ්න නොඅසන්නැයි පවසමින් 28 දා සිදු වුනු පහරදීම් ගැන ඔවුන්ට යලි සිහිපත් කලහ.

සෙනසුරාදා පැවැත්වුනු ඊපීඩීපී හර්තාලය වනාහි, ආන්ඩුව යාපනයේදී ලැබූ අඩු සාර්ථකත්වය නිසා තමන් ඉල්ලා අස් වන්නට යන බව බොරුවට කියා පෑ පක්ෂ නායක දේවානන්දට සහාය පෙන්වීමේ මංමුලා සහගත ප්‍රයත්නයක් විය. කඩසාප්පු වසන ලෙසටත් බස් සේවා නවතා දමන ලෙසටත් බලපෑම් කෙරින. යලි සාමාන්‍ය වැඩ කටයුතු අරඹන ලෙස ආරක්ෂක හමුදා විසින් නියෝග කල විට පක්ෂය ඉක්මනින් ම සිය විරෝධතාව අකුලා ගත්හ.

පසු ගිය සතියේ යාපනයෙහි පැවති ඡන්දය රාජපක්ෂට සහ ෆොන්සේකාට එරෙහි දැඩි චෝදනාවක් විය. දිවයිනේ උතුර සහ නැගෙනහිර විනාශයට පත්කල යුද්ධය සම්බන්ධයෙන් — රාජපක්ෂ ජනාධිපති ලෙස සහ ෆොන්සේකා ඔහුගේ හමුදාපති ලෙස — දෙදෙනා ම වගකිව යුතු විය. පසු ගිය මැයි මාසයේ දී එල්ටීටීඊ පරාජයට පත් වීමේ ප්‍රතිඵලය වශයෙන් "සාමය සහ සමෘද්ධිය" උදා නොවූ අතර මිලිටරි ග්‍රහනය තවත් ශක්තිමත් කෙරුනි. ධනේශ්වර අපේක්ෂකයන් දෙදෙනාම කෙරෙහි පිළිකුල පල කරමින්, ප්‍රදේශයේ ඡන්ද දායකයන්ගෙන් සියයට 74ක් කිසිවෙකුටත් ඡන්දය දුන්නේ නැත.

ඡන්දය දුන් අයගෙන් බහුතරයක් ෆොන්සේකාට සහාය දුන්නේ ඔහු "අඩු නපුර" ලෙස සලකමිනි. එල්ටීටීඊ පරාජයට පත් වන්නට පෙර එහි දේශපාලන හොරනෑව ලෙස කටයුතු කල, දැන් කොළඹ දේශපාලන සංස්ථාපිතය තුල තැනක් සොයමින් සිටින දෙමල ජාතික සන්ධානය (ටීඑන්ඒ) ෆොන්සේකාට සහාය දෙන ලෙස මහජනයාගෙන් ඉල්ලා තිබින. ඡන්දය පැවති දින, ප්‍රදේශය තුල පැවති තියුනු ආතතිය සලකුනු කරමින් යාපනයෙහි බෝම්බ ගනනාවක් පිපිරී ගියේ ය.

යාපනය දිස්ත්‍රික්කයේ ෆොන්සේකාට වඩා සුලු වැඩි ඡන්ද ගනනකින් රාජපක්ෂ ජය ගත් එක ම ඡන්ද කොට්ඨාසය කයිට්ස් ය. නිසැකව ම ඒ, රාජපක්ෂට හෝ ඊපීඩීපීයට පවතින මහජන සහායක් නිසා නො වේ. ඊපීඩීපීය හොර ඡන්ද දැමීමෙහි යෙදී සිටි බව පුද්ගලයන් ගනනාවක් ම ලෝක සමාජවාදී වෙබ් අඩවියට පවසා තිබුනි. දූපතෙන් වැඩි කොටසක් පවතින්නේ නාවික හමුදාවේ දැඩි පාලනය යටතේ ය.

දිස්ත්‍රික්කය තුල පක්ෂය ලත් නින්දා සහගත පරාජය තිබියදීත් අවසානයේ දී ඊපීඩීපී නායක දේවානන්දගේ ඉල්ලා අස් වීම සිදු නොවීය. යාපනයෙහි පල කෙරෙන තිනකුරල් පුවත්පතට ඔහු මෙසේ පැවසී යඃ "මහජනයා නොමග යැවුනු හින්දා ඔවුන් ජනාධිපතිතුමාට [රාජපක්ෂට] ඡන්දය දුන්නේ නැහැ. ඉල්ලා අස් නොවෙන්නැයි ජනාධිපතිත් මහජන නියෝජිතයනුත් ඉල්ලා සිටි නිසා මම ඉල්ලා අස් වෙන්නේ නැහැ."

කයිට්ස්හි වත් වෙන කිසි යම් තැනක වත් දෙමල ජනයා අතර ඊපීඩීපීයට සැලකිය යුතු පදනමක් නැත. ඔවුන් තමන්ට සහාය ලබා ගැනීම සඳහා අල්ලස් දීමට, ආන්ඩුව බෙදා දෙන සහන දීමනා කෙරෙහි විශ්වාසය තබා සිටින අතර එය අසාර්ථක වූ තැන බිය ගැන්වීමෙහි සහ මැරකමෙහි යෙදෙන දේශපාලන සංවිධානයක් බවට පක්ෂය පිරිහී ඇත.

එක දිගට ම ආන්ඩුවේ යුද්ධයට විරුද්ධ වූ හා උතුරෙන් සහ නැගෙනහිරෙන් සියලු හමුදා ඉවත් කල යුතු යැයි ඉල්ලා සිටි සසප සුවිශේෂ ඉලක්කයක් බවට පත්ව ඇත.

2000 වසරේදී නාවික හමුදාව මසුන් ඇල්ලීමට පැනවූ සීමාවන්ට එරෙහිව සසප, ධීවරයන් අතර උද්ඝෝෂනයක් ගෙන ගිය පසුව ඊපීඩීපීය, කයිට්ස්හි සසප සාමාජිකයන්ට කායිකව පහර දී තර්ජනය කලේ ය. නාවික හමුදාව තමන් පැනවූ සීමා කිරීම් බලාත්මක කිරීමේ කටයුත්ත පැවරී තිබුනේ ඊපීඩීපීයට ය. ඔවුන් ප්‍රාදේශීය රැස්වීමක් කැඳවූ නමුත් කිසිවෙකු ඊට සහභාගි වූයේ නැත. එක් රැස්වීමකට සසප සාමාජිකයෙකු ඇද ගෙන ගිය ඊපීඩීපී මැරයෝ පලායන අතර තුර තවෙකෙකුට වෙඩි තැබූහ. සිය දේශපාලන ක්‍රියාකාරකම් තව දුරටත් කර ගෙන ගිය හොත් එහි විපාක විඳින්නට සිදු වන බවට සියලු සසප සාමාජිකයන්ට තර්ජනය කෙරින (බලන්න, "EPDP thugs in the service of Colombo regime: A serious threat to the lives of SEP members in Sri Lanka").

2007 මාර්තු 22 දා, අම්පිහෙයිනගර් බලා යමින් සිටිය දී සසප සාමාජික නඩරාජා විමලේස්වරන් ද ඔහුගේ මිතුරෙකු වූ සිවනාදන් මදිවදනන් ද කයිට්ස්හි දී අතුරුදන් වූහ. එතැන් පටන් ඔවුන් ගැන කිසිදු තොරතුරක් දැන ගන්නට ලැබී නැත. සසපය රැස් කර ගත් සියලු සාක්ෂ්‍යවලින් බලගතු ලෙස ඇඟවෙන්නේ මේ හා සමාන "අතුරුදන් වීම්" සිය ගනනකට වගකිව යුතු නාවික හමුදාව හා ඒ සමඟ හවුලේ කටයුතු කරන ඊපීඩීපීය වැනි සන්නද්ධ කල්ලි මීට සම්බන්ධ බව යි (ඉහත සඳහන් ලිපිය බලන්න)

කයිට්ස්හි දී සිදු වූ මෑත ම ප්‍රහාර වනාහි ජනාධිපතිවරනය අද්දර දී රාජපක්ෂ තන්ත්‍රය සහ එහි සගයන් ප්‍රජාතන්ත්‍රවාදී අයිතීන් මත එල්ල කල පුලුල් ප්‍රහාරයක කොටසකි. රාජපක්ෂට විශාල බහුතරයක් ලැබී ඇති බවක් නිල ප්‍රතිඵලයෙන් පෙන්නුම් කෙරෙතත්, සිය දේශපාලන සංස්ථාපිතය තුල සිටින ප්‍රතිවාදී කන්ඩායම්වලින් තමන් වෙත දිගින් දිගට ම එල්ල වන විරුද්ධත්වයට ද ජීවන තත්ත්වයන් පහල වැටීම මත වැඩෙමින් පවතින වඩා පුලුල්ව පැතිරුනු මහජන අතෘප්තියට ද ආන්ඩුව මුහුන පා සිටී.

අප්‍රේල් මාසයෙහි පවත්වන්නට යන පාර්ලිමේන්තු මැතිවරනය සඳහා සූදානම් වීමේ දීත් වැඩ කරන ජනයාගේ කර මත ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ පටි තද කර ගැනීමේ පිලිවෙත් පැටවීමේ දීත් මර්දනය සහ මැරකම යොදා ගැනීමෙහි ලා ආන්ඩුව කිසි සේත් පසුබට නොවනු ඇති බවට සසපය අනතුරු අඟවයි. යාපනයෙහි සිටින ආන්ඩුවේ ප්‍රධාන ම සගයා වන ඊපීඩීපීය, ලකලැස්ති කෙරෙමින් තිබෙන විධික්‍රම පිලිබඳ නිරූපනයක් දැනට මත් ලබා දී ඇත.

© www.wsws.org